ගනුදෙනු කලහැකි ලියවිලි - ප්‍රශ්ණ

1. ගනුදෙනු කලහැකි ලියවිලි වලට අදාලව මෙරට බලපාන ප්‍රධාන ව්‍යවස්ථාපිත නීතිය කුමක්ද ?
1927 අංක 25 දරන විනිමය බිල්පත් ආඥා පනත

2. ගනුදෙනු කලහැකි ලියවිල්ලක මූලික ලක්ෂණ 04 ක් ලියන්න.

- හුදු භාරදීමෙන් හෝ පිටසන් පිටසන් කර භාරදීමෙන් පැවරුම් ලාභියාට හිමිකම පැවරිය හැකි වීම
- පැවරුම්ලාභියාට එම ලියවිල්ල මත නඩු පැවරීමේ හැකියාව
- ලියවිල්ල පවරන අයගේ හිමිකමේ දෝෂයකින් තොරව පැවරුම් ලාභියාට මනා ශුද්ධ අයිතියක් ලැබීම
- බිල්පත එක් අයෙකුගෙන් තවත් අයෙකු වෙත පැවරීමේදී ඒ සම්බන්ධයෙන් වගකිව යුත්තාට දැනුම් දීමේ අවශ්‍යතාවයක් නොවීම

<u>ක්‍රවුච් එ. ක්‍රෙඩිට් ෆොන්සියර් ඔෆ් ඉන්ග්ලන්ඩ්</u>

යම් ලියවිල්ලක් වාණිජමය ව්‍යවහරය අනුව මුදල් මෙන් භාරදීම මගින් පැවරිය හැකිනම් සහ ධාරකයාට තමා නමින් එම ලියවිල්ල මත නඩු පැවරිය හැකි නම් එය ගනුදෙනු කලහැකි ලියවිල්ලක් සේ සැලකෙන අතර සද්භාවයෙන් හා වටිනාකමකට ලබන්නෙකුට එහි හිමිකම පැවරේ.

3. විවිධ ගනුදෙනු කලහැකි ලියවිලි වර්ග කිහිපයක් සඳහන් කරන්න.
විනිමය බිල්පත් , චෙක්පත් , පොරොන්දු නෝට්ටු

4. නීතියෙන් පිලිගත් අර්ධ වශයෙන් ගනුදෙනු කලහැකි ලියවිලි වර්ග වර්ග කිහිපයක් සඳහන් කරන්න.
ලාභාංශ බලපත්‍ර , කොටස් බලපත්‍ර , ධාරකයාට ගෙවිය යුතු අණකර , තැන්පත් සහතික ,

භාණ්ඩාගාර බිල්පත් , භාණ්ඩාගාර තැන්පත් සහතක , නෞභාර පත්‍ර

5. විනිමය බිල්පතක් යනු කුමක්ද ?
නියමිත පුද්ගලයෙකුට /ඔහුගේ අණට හෝ දරන්නෙකුට යම් න්ශ්චිත මුදල් ප්‍රමාණයක් ඉල්ලූවිට හෝ නිශ්චිත අනාගත දිනයකදී හෝ එහි අණලාභියා විසින් ගෙවිය යුතු බවට , යම් පුද්ගලයෙකු විසින් තවත්පුද්ගලයෙකුට තම අත්සනින් යුතුව , ලිඛිතව කරන කොන්දේසි විරහිත අණකි.(3 (1) වගන්තිය)

විනිමය බිල්පතකින් නියෝගයක් කල යුතුය. <u>උදා</u> - කරුණාකර ගෙවන්න, ගෙවන්න, ගෙවනු

★★★ නමුත් , ගෙවන්නේ නම් මැනවි, ගෙවන්නේ නම් සතුටු වෙමි, වැනි යෙදුම් නියෝග ලෙස පිලි නොගනී. ★★★

JMCvLearning
"your virtual learning partner"

6. විනිමය බිල්පතක පාර්ශවකරුවන් නම් කරන්න.

- **අණකරු** - ගෙවීමක් කිරීමට අණ දෙන්නා, නැතහොත් විනිමය බිල්පතක් ලියා අත්සන් කරන පාර්ශවයයි.

  ♥♥අණකරු සහ ආදායකයා එකම තැනැත්තෙකු විය හැකිය.

- **අණලද්දා (අණලාභියා)** - විනිමය බිල්පතක් සඳහා මුදල් ගෙවන ලෙසට අණක් ලබන්නාය. (මොහු විනිමය බිල්පතේ ප්‍රතිග්‍රාහකයාද වේ.(බිල්පත ප්‍රතිග්‍රහණය කල පසු)

- **ආදායකයා** - විනිමය බිල්පතක් මගින් ගෙවීමක් ලැබීමට හිමිකමක් ඇති තැනැත්තාය. මොහු අණකරුම හෝ වෙනත් අයෙකු විය හැකිය.
- **ප්‍රතිග්‍රාහකයා** - විනිමය බිල්පතෙහි අණ ලද්දා, එය ප්‍රතිග්‍රහණය කල පසු ප්‍රතිග්‍රාහකයා ලෙස හැඳින්වේ.
- **පිටසන්කරු** - විනිමය බිල්පතක්, පිටසන් කිරීම මගින් තවත් කෙනෙකු වෙත පැවරීම කරන්නා
- **පිටසන්ලදු / පිටසන්ලාභියා** - වෙනත් අයෙකු විසින් පිටසන් කල විනිමය බිලක පැවරීම ලබන්නා

බිල්පත් වර්ගීකරණය

දේශීය බිල්පත්

බිල්පත සෑදීම හා මුදල් ගෙවීම යන කාරනා දෙකම

මෙරට තුලම සිදුවන විට හෝ

බිල්පත සෑදීම මෙරට තුල සිදුව, එහි අණලාභියාද

මෙරට ජීවත් වන පුද්ගලයකු වන විට සහ අදාල බිල්

පත්‍රය සඳහා ගෙවීම විදේශයකදී වන විට ....

එය දේශීය බිල්පතකි.

විදේශීය බිල්පත්

දේශීය නොවන ඕනෑම බිල්පතක්

■ දේශීය බිල්පතක් විදේශයකදී පිටසන් කරනු ලැබුවත්, එය තවදුරටත් දේශීය බිල්පත් ගණයට අයත් වේ.

JMC vLearning "your virtual learning partner"

බිල්පත් වර්ගීකරණය

ඉල්ලූවිට ගෙවිය යුතු බිල්පත්

දුටු වහාම හෝ ඉල්ලා සිටි විටක අණ ලද්දා විසින් ගෙවිය යුතු බිල්පත්

කාල බිල්පත්

අනාගතයේ යම් දිනයකදී අණලද්දා විසින් ගෙවිය යුතු බිල්පත්

7. විනිමය බිල්පතක් ප්‍රතිග්‍රහණය කිරීම යනු කුමක්ද ?

විනිමය බිල ප්‍රතිග්‍රහණය කිරීම යනු අණකරුගේ නියමයට අණලාභියා තම කැමැත්ත ප්‍රකාශ කිරීමයි.

(නැතහොත් ණය හිමි විසින් එවන ලද බිල්පත,ණය ගැතියා විසින් ගෙවීමට එකඟ වන බවට අත්සන් කොට පිලිගැනීමයි.)

8. අණලාභියා විසින් බිල්පත ප්‍රතිග්‍රහණය කලද, එය වලංගු ප්‍රතිග්‍රහණයක් නොවන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

- අණලාභියා විසින් එහි අත්සන් නොකිරීම
- මුදල් ගෙවන බවට හැර වෙනත් ක්‍රමයකට තම පොරොන්දුව ඉටුකරන බව ප්‍රකාශ කිරීම

JMC vLearning
"your virtual learning partner"

විනිමය බිල්පත ප්‍රතිග්‍රහණය

සාමාන්‍ය ප්‍රතිග්‍රහණය

අණකරුගේ කොන්දේසි, අණලද්දා විසින් කොන්දේසි විරහිතව පිලිගැනීම

සීමිත ප්‍රතිග්‍රහණය

අණකරුගේ අණට, අණලද්දා විසින් යම් කොන්දේසි එකතු කරමින් එය පිලිගැනීම

9. සීමිත ප්‍රතිග්‍රහණයන්ට උදාහරණ දෙන්න.

- විනිමය බිල්පතෙහි සඳහන් වටිනාකමෙන් භාගයක් පමණක් ගෙවීම (භාගික ප්‍රතිග්‍රහණය)
- විනිමය බිල්පතට මුදල් ගෙවීමට නිශචිත ස්ථානයක් සඳහන් කිරීම (ප්‍රාදේශික ප්‍රතිග්‍රහණය)
- විනිමය බිල්පතට මුදල් ගෙවීමට නිශ්චිත කාලයක් සඳහන් කිරීම
- අණලාභීන් කිහිපදෙනෙක් ඇති අවස්ථාවක, ඔවුන් අතරිනුත් කිහිපදෙනෙක් පමණක් ප්‍රතිග්‍රහණය කිරීම

□ ■ **කොන්දේසි සහිත බිල්පතක් පිලිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බිල්පතක ධාරකයාට ඇත.**

★ ★ ★ **(සීමිත ප්‍රතිග්‍රහණයක් සහිත බිල්පතක් පිලිගෙන භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අභිමතය එහි ධාරකයාට ඇත.)** ★ ★ ★

10. බිල්පතක් ප්‍රතිග්‍රහණය සඳහා අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතු අවස්ථා මොනවාද ?

.● බිල්පත, දුටු පසු ගෙවිය යතු අවස්ථාවක , ගෙවිය යුතුදිනය තීරණය කිරීම සඳහා ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

● බිල්පත අනිවාර්යයෙන්ම ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කල යුතු බව පැහැදිලිවම සඳහන් කොට ඇති විට

● බිල්පත අණලාභියාගේ නිවසේදී හෝ ව්‍යාපාරික ස්ථානයෙන් පරිබාහිර වෙනත් ස්ථානයකදී ගෙවිය යුතු වන විටදී

11. බිල්පතක් ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කිරීමට අදාල නීතිරීති මොනවාද ?

.■ අණලාභියා මියගොස් ඇතිට ඔහුගේ නීත්‍යානුකූල උරුමකරුවන් වෙත ප්‍රතිග්‍රහණය සඳහා බිල්පත ඉදිරිපත් කල යුතුය.

■ අණලාභියා බුන්වත්ව ඇතිවිට ප්‍රතිග්‍රහණය සඳහා බුන්වත් අණලාභියාගේ දේපල භාරකරු වෙත බිල්පත ඉදිරිපත් කල යුතුය.

■ බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කලයුතු යම් ස්ථානයක් තිබේනම් එම ස්ථානයේදී බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කල යුතුය.

■ බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කලයුතු දිනය බැංකු නිවාඩු දිනයක් නම් මීලඟට යෙදෙන ව්‍යාපාරික දිනයේදී බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කල යුතුය.

JMC vLearning "your virtual learning partner"

■ ගිවිසුමකින් හෝ භාවිතයෙන් බලය පවරා ඇතිවිට බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා අණලාභියා වෙත තැපෑල මගින් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

■ බිල්පත කල් ඉකුත් වීමට පෙර,සාධාරණ වේලාවකදී, ව්‍යාපාර කටයුතු කරන දිනයකදී ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කල යුතුය.

■ විනිමය බිල්පත ප්‍රතිග්‍රහණය කිරීමට අදාලව අණලාභීන් කිහිපදෙනෙකු සිටින විට (හවුල් කරුවන් හැර) එයින් එක් තැනැත්තෙකුට බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා බලය පවරා නොමැති විටදී සියලුම අණලාභීන් වෙත බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කල යුතුය.

12. බිල්පතක් ප්‍රතිග්‍රහණය නොකිරීම හේතුකොට ගෙන අගරු වූවා සේ සලකනු ලබන අවස්ථා මොනවාද ?

- විනිමය බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා අණලාභියා වෙත ඉදිරිපත් කල පසු අණලාභියා විසින් සාමාන්‍ය චාරිත්‍රානුකූල කාලසීමාව වන පැය 24 ක් තුල ප්‍රතිග්‍රහණය නොකිරීම.
- අණලාභියා විසින් සීමිත ප්‍රතිග්‍රහණයක් සිදුකර ඇති විට
- විනිමය බිල්පත ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසුව, මුදල් ලබාගැනීම සඳහා ඉදිරිපත් කල විට ප්‍රතික්ෂේප කිරීම.
- අණලාභියා විසින් එම විනිමය බිල්පත ප්‍රතිග්‍රහණය කිරීම ප්‍රතික්ෂේප කිරීම.

13. යථාකාලීන ධාරකයා යනු කවරෙක්ද ?

බැලූබැල්මට අංග සම්පූර්ණ හා ක්‍රමවත් බිල්පතක්, කල් ඉකුත්වීමට පෙර, සද්භාවයෙන් හා සාධාරණ මිලකට, මින්පෙර එය අගරුවී ඇත්නම් එලෙස අගරු වූ බවක් නොදැන, බිල්පත ඔහුට හුවමාරු කල අවස්ථාවේ ගනුදෙනු කල තැනැත්තාගේ හිමිකම පිලිබඳ ඌනතාවක් පැවති බවක් නොදැන එකී බිල්පත ලබා ගත් අයෙකි.

අගයක් නොමැතිව දරන්නා - යම්කිසි විනිමය බිල්පතක් අගනා ප්‍රතිෂ්ඨාවක් ගෙවීමෙන් තොරවලබාගත් අයෙකි. උදා - උදාරි විසින් තම පෙම්වතාට උපන්දින තෑග්ගක් ලෙස රුපියල් 50000 ක් වටිනා විනිමය බිල්පතක් ලබා දෙයි. මෙහිදී එම පෙම්වතා එකී බිල්පත සම්බන්ධයෙන් “අගයක් නොමැතිව දරන්නෙකි”.

අගයක් සඳහා දරන්නා - විනිමය බිලක් සඳහා අගනා ප්‍රතිෂ්ඨාවක් ගෙවීමෙන් පසුව එය ලබාගත් අයෙකි.

මෙහිදී එය ලබාගත් තැනැත්තාට හිමි වන්නේ තමා වෙත එය පැවරූ තැනැත්තාට තිබූ අයිතියට සමාන අයිතියකි. එනම් බිල්පත පැවරුම්කරුගේ හිමිකම දෝෂ සහිත නම්, පැවරුම් ලාභියාගේ හිමිකමද දෝෂ සහිතය. තවද , අගයක් ගෙවා යම් විනිමය බිල්පතක් ලබාගෙන ඇත්නම්, ඔහුට සිය අයිතිවාසිකම් ලබාගැනීම පිණිස තමාගේ නමින් එම බිල්පතෙහි පැවරුම්කරු ට එරෙහිව නඩු පැවරිය හැක.

14. යථාකාලීන ධාරකයකුගේ අයිතිවාසිකම් මොනවාද ?

- ◈ තමාගේ නමින් බිල්පත මත නඩු පැවරිය හැක.
- ◈ තම හිමිකමේ දෝෂ තිබුනද, ඔහු බිල්පතට ගෙවීමක් ලබාගන්නේ නම් එලෙස නිසි පරිදි ගෙවන්නෙකුට බිල්පත මත වලංගු නිදහස් කිරීමක් ලැබේ.
- ◈ එකී බිල්පත සද්භාවයෙන් ලබාගෙන ඇත්නම්, එය තමා වෙත පැවරූ පාර්ශවයට බිල්පතේ හිමිකම සම්බන්ධයෙන් දෝශයක් තිබුනද, එම දෝෂ වලින් නිදහස්ව, බිල්පතෙන් වගකීමට බැඳුණු සියලු දෙනාටම එරෙහිව, මුදල් ගෙවීම බලාත්මක කිරීමට හැකි වන ආකාරයට ඔහු බිල්පත දරයි.
- ◈ ඔහුට තමාගේ නමින් බිල්පත මත නඩු පැවරිය හැක.

විනිමය බිල්පතක් ගනුදෙනු කිරීම

ධාරක බිල්පත්

("හෝ රැගෙන එන්නාට" යන්න සඳහන්ව ඇති විට)

හුදු පැවරීමෙන්

ඇණවුම් බිල්පත්

("හෝ රැගෙන එන්නාට" යන්න සඳහන්ව නැති විට)

ධාරක විසින් පිටසන් කර පැවරීමෙන්

JMC vLearning
"your virtual learning partner"

15. විනිමය බිල්පතක් පිටසන් කිරීම යනු කුමක්ද ?

විනිමය බිල්පතක පිටුපස එහි හිමිකරු හෝ එහි ධාරකයා විසින්, එහි ගෙවීම වෙනත් අයෙකුට ලබාගත හැකි වන සේ සිය අත්සන තැබීම හෝ සිය නම ලිවීම.

16. වලංගු පිටසන් කිරීමක තිබිය යුතු අවශ්‍යතා මොනවාද ?

- ◆ එම බිල්පත මතම පිටසන් කල යුතුය.

◆ එම පිටසන් කිරීම බිල්පතේ සම්පූර්ණ වටිනාකමට පිටසන් කිරීමක් විය යුතුය.

◆ හවුල්කරුවන් නොවන දෙදෙනෙකුට හෝ ඊට වැඩි ආදායකයන් හෝ පිටසන්ලාභීන් සංඛ්‍යාවකට ගෙවිය යුතු වනවිට, අනෙක් අය වෙනුවෙන් ඉන් එක් අයෙකුට පිටසන් කිරීමේ බලය පවරා නොමැති අවස්ථාවක සියලුම පාර්ශවයන් එම බිල්පත පිටසන් කල යුතුය.

උදා - සමාගමක බලයලත් නිලධාරීන් කිහිපදෙනෙක් විසින් බිල්පත අත්සන් කල යුතු අවස්ථාවක්

විනිමය බිලක පිටසන් වර්ග

හිස් පිටසන

⬇⬇⬇⬇

පිටසන් ලබන්නා සඳහන් නොවේ. ධාරකයාට ගෙවිය යුතුය

උදා -

විශේෂ පිටසන

⬇⬇⬇⬇

ගෙවිය යුත්තේ කාටද, කාගේ අණටද යන්න සඳහන් වූ අවස්ථාවකි.

උදා -

කොන්දේසි සහිත පිටසන

⬇⬇⬇⬇

පිටසන් කරන්නාගේ අත්සනට යම් කොන්දේසියක් පනවා පනවා ඇති අවස්ථාවකි.

උදා -

සීමාකාරී පිටසන

⬇⬇⬇⬇

තවදුරටත් ගනුදෙනු කිරීම තහනම් කරයි.

උදා - ඒ ට පමණක් ගෙවන්න.

බී -

<u>✸✸✸ විධාන (ඇණවුම්) බිල්පතකට පිටසනක් යෙදීම නිසා විධාන බිල්පතක් ධාරක බිල්පතක් බවට පත්වේ. ✸✸✸</u>

17. විනිමය බිල්පතක් ගෙවීම ලබාගැනීම සඳහා අණලාභියා වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අවස්ථා කිහිපයක් නම් කරන්න.

▲ සාධාරණ උත්සාහයකින් පසු බිල්පත අණලාභියා වෙත ඉදිරිපත් කල නොහැකි අවස්ථාවක

▲ අණලාභියා ව්‍යාජ පුද්ගලයෙකු වන අවස්ථාවක

JMC vLearning "your virtual learning partner"

▲ බිල්පත ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමට ඇති අවශ්‍යතාවය, ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් අතහැර දැමිය හැකි යැයි දක්වා ඇති අවස්ථාවක

▲ බිල්පතේ අණලාභියා හෝ ප්‍රතිග්‍රාහකයා බිල්පත ප්‍රතිග්‍රහණය කිරීමට හෝ ගෙවීමට බැඳී නොමැති අවස්ථාවක සහ බිල්පත ගෙවීම් ලබාගැනීම සඳහා ඉදිරිපත් කලහොත්, ඒ සඳහා ගෙවනු ඇතැයිවිශ්වාස කිරීමට කිසිඳු හේතුවක් බිල්පතේ ධාරකයාට නොමැති අවස්ථාවක

▲ බිල්පත ප්‍රතිග්‍රහණය කරනු ලැබුවේ හෝ තැපෑලට දමනු ලැබුවේ පිටසන් කරුවෙකුට පහසුකම් සලසා දීමට වන අවස්ථාවක සහ එය ගෙවීම් ලබාගැනීම සඳහා ඉදිරිපත් කලවිට ගෙවනු ඇතඅයි විශ්වාස කිරීමට කිසිඳු සාධාරණ හේතුවක් බිල්පතේ ධාරකයාට නොමැති අවස්ථාවක

▲සාධාරණ උත්සාහයකින් පසු බිල්පත එහි ප්‍රතිග්‍රාහකයා වෙත ඉදිරිපත් කල නොහැකි අවස්ථාවක

18. නොගෙවීම මත බිල්පතක් අගරු වන අවස්ථා මොනවාද ?

⦿ විනිමය බිල්පත යථා පරිදි ගෙවීම් ලබාගැනීම සඳහා ඉදිරිපත් කලද, ඊට ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක හෝ ගෙවීම ලබාගත නොහැකි අවස්ථාවක

⦿ බිල්පත මත ගෙවීම් ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයෙන් එම බිල්පත නිදහස් කොට ඇති විටක, බිල්පත කල් ඉකුත්ව සහ නොගෙවා ඇති අවස්ථාවක

19. විනිමය බිල්පතක් නිදහස් කළ හැක්කේ කුමන අවස්ථා වලදීද ?

■ අණකරු හෝ ප්‍රතිග්‍රාහකයා විසින් හෝ වෙනුවෙන් විනිමය බිල්පත යථාකාලයේදී ගෙවීමෙන්

■ බිල්පත කල්පිරෙන අවස්ථාවේදී බිල්පත ප්‍රතිග්‍රහණය කල පාර්ශවයම එහි ධාරකයා වීමෙන්

■ බිල්පතේ ධාරකයා එය කල්පිරෙන අවස්ථාවේදි සම්පූර්ණයෙන්ම හා කොන්දේසි විරහිතව ප්‍රතිග්‍රාහකයාට එරෙහිව තමාට ඇති සියලුම අයිතිවාසිකම් අතහැර දැමීමෙන්

■ ධාරකයා විසින් බිල්පත සිතාමතාම අවලංගු කිරීමෙන්

■ විනිමය බිල්පත් ආඥාපනතේ ප්‍රතිපාදන වලට යටත්ව, බිල්පත හෝ එහි ප්‍රතිග්‍රහණය එම බිල්පත පිලිබඳව වගකිව යුතු සියලු පාර්ශවයන්ගේ කැමැත්ත රහිතව බරපතල ලෙස වෙනස් කර ඇති අවස්ථාවක

පිලිසරණ බිල්පතක් යනු යම් ගෙවීමක් පියවීම සඳහා නොව අණකරුගේ මූල්‍යමය අවශ්‍යතා

පියවීම සඳහා උපකාර වීමට (පිලිසරණ වීමට) අණලාභියා විසින් ප්‍රතිග්‍රහණය කරනු ලැබූ බිල්පතකි.

පිලිසරණ බිල්පතක් නිදහස් වන්නේ.පිලිසරණ පාර්ශවය විසින් එය නිසි පරිදි ගෙවා දැමීම මගිනි.

පිලිසරණ පාර්ශවය යනු බිල්පතෙන් වටිනාකමක් නොලැබ, සිය නාමය වෙනත් පාර්ශවයකගේ ප්‍රයෝජනයට ලබා දීමේ අරමුණෙන් බිල්පතේ අණකරු,ප්‍රතිග්‍රාහක හෝ පිටසන්කරු ලෙස අත්සන් කරනු ලබන තැනැත්තෙකු වේ.

පිලිසකර බිල්පතක් යනු විනිමය බිල්පතෙහි මුහුණත මත යථා පරිදි යම් වෙනස් කිරීමක් (පිලිසකර කිරීමක්) කරන ලද බිල්පතකි.

20. පොරොන්දු නෝට්ටුවක් යනු කුමක්ද ?

නියමිත පුද්ගලයෙකුට හෝ දරන්නාට හෝ එවන් නියමිත පුද්ගලයෙකුගේ එකී දරන්නාගේ නියමය මත ඉල්ලා සිටි විටකදී හෝ නියමිත හෝ තීරණය කල හැකි අනාගත දිනයකදී , නියමිත මුදලක් ගෙවීමට එකී පොරොන්දුව දෙන අයගේ අත්සන යටතේ, එක් පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකු වෙත කරනු ලබන කොන්දේසි විරහිත ලිඛිත පොරොන්දුවක් පොරොන්දු නෝට්ටුවක් නම් වේ.

21. චෙක්පතක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

. චෙක්පතක් යනු ඉල්ලූවිට ගෙවන ලෙස බැංකුකරුවකු වෙත අණකල ගිණුම් හිමියාගේ අත්සන යටතේ ගිණුම් හිමියා විසින් බැංකුකරු වෙත අණකල විනිමය බිලකි.

එනම් සෑම චෙක්පතක්ම විනිමය බිලක් වේ. එහෙත් සෑම විනිමය බිලක්ම චෙක්පතක් නොවේ.

22. බැංකු කරුවෙකු වෙත , යම් තැනැත්තෙකුට ගෙවීම සඳහා ලද පූර්ව නියෝගයක් අවසන් වන ලෙස සලකනු ලබන අවස්ථා මොනවාද ?

. ● ප්‍රතිනියෝගකරණයක් මගින් (Stop Payment)

● ගනුදෙනු කරු මියගිය බව දැනගන්නට ලැබීමෙන්

● අණකරුට විරුද්ධව විසිරුවා හැරීමේ පෙත්සමක් පිලිබඳව දැන්වීමක් ලැබීමෙන්

● අණකරුට විරුද්ධව වස්තු භංගත්ව පෙත්සමක් ඉදිරිපත් වී ඇතිබව දැනගන්නට ලැබීමෙන්

23. චෙක්පතක් රේඛණය කිරීම යනු කුමක්ද ?

යම් චෙක්පතකට ගෙවීම් කවුලුවෙන් නොගෙවන ලෙසත්, බැංකු ගිණුමක් හරහා පමණක් ගෙවිය යුතු බවටත් ගෙවනු ලබන බැංකුවට කරනු ලබන දැනුම් දීමකි.සමාන්තර රේඛා දෙකක් චෙක්පත මත ඇඳීම මගින් චෙක්පත රේඛණය කෙරේ. ඊට අමතරව එම රේඛණය තුල විවිධ වචනද තිබිය හැකිය.

24. විවිධ රේඛණ වර්ග විස්තර කරන්න.

සාමාන්‍ය රේඛණය

චෙක්පත මත සමාන්තර රේඛා දෙකක් ඇඳ එය හිස්ව තබා ඇතිනම් හෝ සහ සමාගම යන වචනය ඇතිව රේඛනය කර ඇතිවිට , එය සාමාන්‍ය රේඛණයයි.

විශේෂ රේඛණය

චෙක්පතක් රේඛණය කර ඒ මත යම් නිශ්චිත වාණිජ බැංකුවක නම සඳහන් කර ඇති අවස්ථාවකි.

(මෙහිදී මෙවන් චෙක්පතක් මත අණලාභී බැංකුවට මුදල් ගෙවිය හැකි වන්නේ, එකී විශේෂ රේඛණයට යටත් බැංකුව වෙත පමණි.)

මෙහිදී "ගෙවීම් කරනු ලබන බැංකුව" වන්නේ අණලාභී බැංකුවයි.

මෙහිදී එකී ගෙවීම "රැස් කරන බැංකුව" වන්නේ එකී විශේෂ රේඛණයට යටත් බැංකුවයි.

ගනුදෙනු කල නොහැක රේඛණය

රේඛණය කරන ලද චෙක්පතක් මත "ගනුදෙනු කල නොහැකිය" යන වාක්‍ය ඛණ්ඩය ලියා ඇති අවස්ථාවකි. මෙලෙෂ සටහන් වුවද වෙනත් ඕනෑම චෙක්පතක් මෙන්ම මෙම චෙක්පතද ගනුදෙනු සඳහා යොදාගත හැකිය. නමුත් මෙම වාක්‍ය ඛණ්ඩය ලිවීමේ නෛතික ප්‍රතිපලය නම් එවන් චෙක්පතක් කලින් දැරූ තැනැත්තාට තාබූ අයිතිය මිස ඊට වඩා හොඳ ශුද්ධ හිමිකමක් පැවරුම් ලාභියාට නොලැබීමයි.

JMC vLearning "your virtual learning partner"

ආදායකයාගේ ගිණුමට පමණයි රේඛණය

යම් චෙක්පතක නිශ්චිත ආදායෙකුගේ නම සඳහන් කොට එකී චෙක්පත මත "ආදායකයාගේ ගිණුමට පමණයි" ලෙස ලියා ඇති අවස්ථාවකි. එවිට එකී චෙක්පත මත මුදල් බැර කල හැක්කේ එහි නම සඳහන් ආදායකයාගේ ගිණුමට පමණි.

මෙවන් චෙක්පතකට කවුන්ටරයෙන් මුදල් ලබා ගත නොහැකිය.

යම් චෙක්පතක මුදල් ගෙවන්නා යන්නට "මුදල්" (cash) යන වචනය යොදා එම චෙක්පත මත "ආදායකයාගේ ගිණුමට පමණයි" යන වචන ලියා එය රේඛණය කර ඇත්නම් එය වලංගු චෙක්පතක් නොවේ.

25. රේඛණය කරන ලද චෙක්පතක් සම්බන්ධයෙන් බැංකු කරුවකුගේ යුතුකම් මොනවාද ?

යම් චෙක්පතක එකිනෙකට වෙනස් වූ බැංකු දෙකක් වෙත විශේෂ රේඛණ දෙකක් කර ඇත්නම් එම රේඛණය වලංගු නැත. එමනිසා එම චෙක්පත මත මුදල් ගෙවීම, අණලාභී බැංකුව විසින් ප්‍රතික්ෂේප කල යුතුය.

චෙක්පතක් එක් බැංකුකරුවකුට වඩා වැඩි බැංකුකරුවන් සංඛ්‍යාවකට විශේෂිතව රේඛණය කල විට එම චෙක්පතේ අණලාභී බැංකුකරු ඒ චෙක්පත සඳහා ගෙවීම් සිදුකලේ නම්, එම බැංකුකරු චෙක්පතේ නියම හිමිකරුට වගකීමට බැඳේ.

චෙක්පත මත සාමාන්‍ය රේඛණයක් කර ඇති අවස්ථාවක එම චෙක්පතෙන් අණලද බැංකුකරු ,බැංකු-කරුවකු නොවන වෙනත් පාර්ශවයකට ගෙව්වේ නම්, එම බැංකුකරු චෙක්පතේ නියම හිමිකරුට වගකිව යුතුය.

26. රේඛණය කරන ලද චෙක්පතක් සම්බන්ධයෙන් බැංකු කරුවකුට තිබෙන ආරක්ෂාව කුමක්ද ?

අදාල චෙක්පත මත සද්භාවයෙන් හා නොසැලකිලිමත් බවෙන් තොරව ගෙවීමක් කල අණලාභී බැංකුකරුවකු , එම චෙක්පත මත නියම හිමිකරුට ගෙවූවිට ඇතිවන අයිතිවාසිකම් හා තත්වයට හිමිකම් ලබයි.

අදාල චෙක්පත මත සද්භාවයෙන් හා නොසැලකිල්ලෙන් තොරව ගනුදෙනුකරුවකු වෙනුවෙන් රේඛණය කල චෙක්පතක ගෙවීමක් ලබාගත් විට, එම ගනුදෙනුකරුගේ හිමිකම දෝෂ සහගත වූවත් නියම හිමිකරු වෙත බැංකුකරු විසින් වගකිව යුතු නැත.

JMC Learning "your virtual learning partner"

චෙක්පතක පැවතිය යුතු ප්‍රධාන ලක්ෂණ

- ▲ ලිඛිත වීම
- ▲ කොන්දේසි විරහිත නියෝගයක් වීම
- ▲ අණලාභියා බැංකුවක් වීම
- ▲ අණකරු අත්සන් කර තිබීම
- ▲ නිශ්චිත මුදල් ප්‍රමාණයක් සඳහන් වීම
- ▲ ඉල්ලූ විට ගෙවිය යුතු වීම

චෙක්පත් භාවිතයේ විශේෂ වාසි

■ විශාල වටිනාකමකින් යුත් ගෙවීම් මුදලින් ගෙවනවාට වඩා ආරක්ෂිතව ගෙවීමට හැකියාව ලැබීම සහ පහසු බව.

■ චෙක්පත් වලින් ගෙවීම නිසා කාලය ඉතිරි වේ.

■ ගෙවීම් කල බව පහසුවෙන් ඔප්පු කල හැකිය.

■ චෙක්පත නිකුත් කිරීමත්, එය මුදල් කර ගැනීමත් අතර වන කාල පරතරය මගින් ඇතිවන වාසිය.

■ මුදල් මෙන් ඇතිවිය හැකි දෝෂයන් බොහෝදුරට වලක්වා ගත හැකි වීම.

විනිමය බිල්පතක් පිටසන් කිරීමේ නෛතික ප්‍රතිපල

✸ බිල්පත සම්බන්ධ අයිතිය **පිටසන්ලාභියා** වෙත මාරුවේ.

✸ බිල්පත තවදුරටත් ගනුදෙනු කරීමේ අයිතිය **පිටසන්ලාභියා** සතුවේ.

✸ **බිල්පත අගරු වූ විට සිය අයිතිවාසිකම් වෙනුවෙන් එහි පිටසන් කරුට විරෙහිව නඩු පැවරීමට පිටසන්ලාභියාට අයිතිය ලැබේ.**

චෙක්පත්වලට අදාලව බැංකුකරුවන්ගේ යුතුකම්

- හැකි ඉක්මනින් අය ලබාගැනීමට ක්‍රියා කිරීම.
- අණට අදාල චෙක්පත් වලට ගෙවීම් කිරීම.
- චෙක්පත් අගරු වුවහොත් ඒ පිලිබඳව ගනුදෙනුකරුවන්ට ඉක්මනින් දැනුම් දීම.
- ගිණුම් වාර්ථා ඉදිරිපත් කිරීම.
- රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ යුතුකම
- සාධාරණ සැලකිල්ලකින් යුතුව කටයුතු කිරීමේ යුතුකම

විනිමය බිල්පත්	චෙක්පත්

විනිමය බිල්පත්	පොරොන්දු නෝට්ටු

චෙක්පත්	පොරොන්දු නෝට්ටු

JMC vLearning
"your virtual learning partner"

Specimen of a Bill of Exchange

Stamp

Chandni Chowk,
Delhi-6
31 January, 1999

Rs. 5,000

Three months after date pay to me or order, the sum of Rupees Five Thousand only for value received.

To,
Shri V.K. Jain
Model Town
Delhi-9

Subhash Gupta

a Bill of Exchange

London, 27 Sept 1999 **Amount** £ 25,000.00 g

At 60 Days after Sight f **pay against this Sole Bill of Exchange**

to the order of Ourselves h

the sum of Twenty five thousand Pounds Sterling g

for value Received

To:
c International Buyers Limited
e 35th Floor, Two Exchange Square
Connaught Place
Hong Kong

For and on behalf of b
UK Exporters Limited

J Jones

J Jones d
Managing Director

JMC vLearning
"your virtual learning partner"

Sample Format – Bill of Exchange

Amount - 2,00,000 Place, Date

Stamp

60 days after the date, pay Mr. ABC a sum of 2,00,000, for value received.

Accepted	Drawer
(Signed)	(Signed)
Drawee's Name	Drawer's Address
Drawee's Address	

www.AccountingCapital.com
JMC vLearning
"your virtual learning partner"